# දිවයින

# 2013. 10. 09

*මහලේකම්තුමා ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී.*

**එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ විශේෂ රැස්වීමක් පසුගිය සඳුදා (07 දා) පැවැති අතර, පක්ෂයේ ජයග්‍රාහී මාවතකට අවතීර්ණ කිරීමට නම් බෙදී වෙන්වී එකිනෙකා විවේචනය කර ගනිමින් නොසිට සමගියෙන් කටයුතු කළ යුතු බව එහිදී අවධාරණය වුණා. පක්ෂය දිනන මාවතකට ගැනීමට එලෙස සමගිය ඇති කළ යුතු බව එහිදී සාකච්ජා වූ පළමු කාරණාවයි.**

**එක්සත් ජාතික පක්ෂ නායක සහ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා මෙහිදී විශේෂ ප්‍රකාශයක් සිදු කළා. පක්ෂය ජයග්‍රහණය සඳහා මෙහෙය විය හැකි නායකයෙක් සඳහා තම නායකත්වය පැවරීමට සූදානම් බව එතුමා ප්‍රකාශ කළා.**

**එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය සුපර්ස්ටාර් තරගවල සිදුවන අන්දමේ ජයග්‍රහණයක් නොවන බැවින් ඉදිරි කාලසීමාව තුළ එම අරමුණු ඉටු කර ගැනීම සඳහා කැපවී වැඩ කරන ලෙස ද එතුමා දන්වා සිටි අතර එකිනෙකාගේ කකුලෙන් අදිමින් අඩුපාඩු ඇති බවට සටන් කිරීම විසඳුමක් නොවන බව ද අවධාරණය වුණා.**

**නායකත්වය ප්‍රදර්ශනය කරන කෙනෙකුට නායකත්වය පරිත්‍යාග කිරීමේ ගැටලුවක් නොවන බවත්, එම නායකත්වය ආදර්ශයෙන් පෙන්වන ලෙසත් එතුමා ප්‍රකාශ කළා.**

ඉරිදා ලංකාදීප

**2013. 10. 13**

එදින සවස කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම පැවැත්වූයේ ද සිරිකොතදීය. මෙහිදී විපක්ෂනායකවරයා ඉතාමත් සංවේදී කතාවක් ඉදිරිපත් කළේය.

"මම එජාපයේ නායකත්වය බාර ගත්තේ 1994 වර්ෂයේ දී. ඒ වෙලාවේ විපක්ෂයේ නායකත්වය අහිමි වුණු වෙලාවක්. ත්‍රස්තවාදය නිසා ඉදිරිපෙළ නායකයන් අපට අහිමිවෙලා තිබුණා. 17 වසරක පාලනයෙන් පසු පරාජය වුණු වෙලාවක්. එදා සිට මම වෙහෙසක් දරලා පක්ෂය රැකගත්තා. සමහරු මට යන්න කියනවා. පක්ෂයට ආදරය කරන බහුතරය මට ඉන්න කියනවා.

ඉදිරියේ දී පක්ෂයේ නායකත්වය භාර අරගෙන වැඩ කරන්න පුලුවන් කෙනෙකුට මම ඒක බාර දෙන්න මම සූදානම්. එහෙත් පක්ෂයේ භාරකාරයකු ලෙස මට ඉන්න කියනවා. මැතිවරණ පරාජය එක්ක දේශපාලන මණ්ඩලයකට උත්තරීතර කමිටුවකට මම මේ බලතල දෙන්න සූදානම්. ඒ වගේම ඉදිරියේ දී පක්ෂය ජයග්‍රහණය කරවන්න පක්ෂය සමගි කරවන්න ඒ කමිටුවේ සභාපතිවරයා විදියට කරු ජයසූරිය මහත්මයාව නම් කරනවා. ඔබලා ඊට අනුමැතිය ලබා දෙන්න" වික්‍රමසිංහ මහතා කියා සිටියේය.